අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர்தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

**29 S I**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time -10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:

- ❖ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ❖ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- ❖ උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ❖ 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (✕) යොදා දක්වන්න.

1 සන්නිවේදන අධ්‍යයනය නමින් ස්වාධීන විෂයය ක්ෂේත්‍රයක් ලෙස හැඳින්වීමට පෙර, තම පර්යේෂණ කෘති තුළින් ඒ සඳහා අවශ්‍ය පදනම සැකසූ විද්වතුන් තිදෙනා වන්නේ,

(1) විල්බර් ශ්‍රාම්, කර්ට් ලෙවින් සහ ක්ලෝඩ් ශැනන් ය.

(2) චාල්ස් හෝර්ටන් කූලි, වෝල්ටර් ලිප්මන් සහ ජෝන් ඩූවී ය.

(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල්, පෝල් එෆ්. ලැසාස්ෆෙල්ඩ් සහ කර්ට් ලෙවින් ය.

(4) ජෝර්ජ් ගාබ්නර්, වොරන් වීවර් සහ රේ එල්ඩන් හයිබර්ට් ය.

(5) මාෂල් මැක්ලූහන්, එඩ්වඩ් එල්. බර්නීස් සහ අයිවී ලී ය.

2 මානව සන්නිවේදනයේ ප්‍රබලත ම නිර්මාණාත්මක ප්‍රකාශන ක්‍රමය වන්නේ,

(1) තොරතුරුයි. (2) භාෂාවයි. (3) මාධ්‍යයයි. (4) හඬයි. (5) රූපයයි.

3 'සංඥා භාෂාව' සහ 'සිරුරු බස' ප්‍රධාන වශයෙන් අයත් වන්නේ කුමන සන්නිවේදන ස්වරූපයකටද?

(1) වාචික සන්නිවේදනය (2) ලිඛිත සන්නිවේදනය (3) කථන සන්නිවේදනය

(4) නිර්වාචික සන්නිවේදනය (5) දෘශ්‍ය සන්නිවේදනය

4 අතිශය සංකීර්ණ හැඟීම්, අදහස්, සංකල්ප ආදිය පිළිබඳ තොරතුරු හුවමාරු කරගැනීමට හැකියාව ලැබෙන සන්නිවේදන ස්වභාවය වන්නේ,

(1) සන්නිවේදනයේ අරමුණු සහගත බවයි. (2) සන්නිවේදනයේ සංකේතාත්මක බවයි.

(3) සන්නිවේදනයේ සන්දර්භානුගත බවයි (4) සන්නිවේදනය බලය වන බවයි.

(5) සන්නිවේදනය ක්‍රියාපටිපාටියක් වන බවයි.

5 තමාටම කතා කරගනිමින්, තීරණ ගැනීම සහ ස්ව-සංකල්පය ගොඩනගා ගැනීමට උපකාරී වන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයි. (2) සමූහ සන්නිවේදනයයි. (3) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයයි.

(4) ජන සන්නිවේදනයයි. (5) අතථ්‍ය සන්නිවේදනයයි.

[දෙවැනි පිටුව බලන්න.]

6 HUB ආකෘතියට අනුව, සන්දේශයක් සමාජගත වීමට පෙර එය පාලනය කිරීම හඳුන්වන්නේ,

(1) නියාමනය ලෙසයි. (2) දොරටුපාලනය ලෙසයි. (3) පෙරහනු ලෙසයි.
(4) සම්ප්‍රේෂණය ලෙසයි. (5) විස්තාරණය ලෙසයි.

7 සන්නිවේදනයේ රේඛීය ස්වභාවය පමණක් අවධාරණය කරන 'ප්‍රතිපෝෂණය' සහ 'බාධක' යන අංග ඇතුළත් **නො වන** ආකෘතිය වන්නේ,

(1) ශැනන් සහ වීවර් ආකෘතියයි. (2) ශ්‍රාම් සහ ඔස්ගුඩ් ආකෘතියයි. (3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතියයි.
(4) විල්බර් ශ්‍රාම් ආකෘතියයි. (5) HUB ආකෘතියයි.

8 ලෝකයේ ප්‍රථම මහජන සම්බන්ධතා කාර්යාලය ආරම්භ කරන ලද්දේ කවුරුන් විසින්ද?

(1) එඩ්වඩ් එල්. බර්නීස් (2) ජේම්ස් ගෲනිග් (3) පිලිප් කොට්ලර්
(4) ජෝන් මැක්ලීන් (5) අයිවී ලී

9 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂණයේ සහ ප්‍රකාශනයේ නිදහස තහවුරු කර ඇත්තේ,

(1) 10 වැනි ව්‍යවස්ථාවෙනි. (2) 15/1/13 වැනි ව්‍යවස්ථාවෙනි. (3) 14 (1) (අ) ව්‍යවස්ථාවෙනි.
(4) 15/7/12 වැනි ව්‍යවස්ථාවෙනි. (5) 19 වැනි ව්‍යවස්ථාවෙනි.

10 පුවත්පතක විශේෂාංග අතරට අයත් නො වන්නේ,

(1) තීරු ලිපියි. (2) කතුවැකියයි. (3) කෙටි කතායි. (4) ප්‍රවෘත්තියි. (5) චිත්‍ර කතායි.

11 නව මාධ්‍ය හරහා මානව මැදිහත් වීමකින් තොර ව විවිධ ආයතන විසින් ග්‍රාහකයා වෙත කෙටි පණිවිඩ එවනු ලබයි. නව මාධ්‍යවල ඇති එම ලක්ෂණය හඳුන්වනු ලබන්නේ,

(1) ස්වයංකරණයයි. (2) අන්තර් ක්‍රියාකාරීත්වයයි. (3) ජාලගතකරණයයි.
(4) අංකිතකරණයයි. (5) අධිපාඨනීයත්වයයි.

12 සාම්ප්‍රදායික මාධ්‍යවල සුවිශේෂ ලක්ෂණයක් වන්නේ,

(1) සංකීර්ණ ව්‍යුහයකින් යුක්ත වීමයි. (2) නියත කර්තෘත්වයක් පැවතීමයි.
(3) සංස්කෘතික සන්දර්භය මත පදනම් වීමයි. (4) අධික පිරිවැයක් දැරීමට සිදුවීමයි.
(5) නූතන තාක්ෂණික මෙවලම් භාවිත වීමයි.

13 ගුවන්විදුලි නාට්‍යයක දී සවන් දෙන්නාගේ පරිකල්පනය අවදි කිරීම සඳහා යොදාගන්නා ශබ්ද ප්‍රයෝග, සංගීතය මෙන් ම තවත් ප්‍රබල උපක්‍රමයක් වන්නේ,

(1) දීර්ඝ විස්තර කිරීම් භාවිත කිරීමයි. (2) සෑම අවස්ථාවකදී ම ගීත යොදා ගැනීමයි.
(3) සැමවිටම වේගවත් කථනයේ යෙදීමයි. (4) ප්‍රවෘත්ති නිවේදන ආකෘතිය භාවිත කිරීමයි.
(5) නිහඬතාව අර්ථවත් ලෙස භාවිත කිරීමයි.

14 සන්නිවේදන සමීක්ෂණයක දී සමස්තය නියෝජනය වන පරිදි තොරතුරු එක්රැස් කිරීමට තෝරාගන්නා කුඩා කණ්ඩායම හඳුන්වන්නේ,

(1) දත්ත දායකයින් ලෙසිනි. (2) නියැදිය ලෙසිනි. (3) ජනගහනය ලෙසිනි.
(4) සමීක්ෂකයින් ලෙසිනි. (5) විචල්‍යයන් ලෙසිනි.

15 මාධ්‍ය විචාරයේ දී, මාධ්‍ය මගින් ධනවාදී සමාජයේ පවතින බල ව්‍යුහය සහ පන්ති පරතරය ආරක්ෂා කරන ආකාරය පිළිබඳ අවධානය යොමු කරන විචාර ප්‍රවේශය කුමක්ද?

(1) මනෝ විශ්ලේෂණ විචාරය (2) ස්ත්‍රීවාදී විචාරය (3) සෞන්දර්යාත්මක විචාරය
(4) මාක්ස්වාදී විචාරය (5) ඓතිහාසික විචාරය

16 සංවර්ධන ව්‍යාපෘතියක් යනු,

(1) නිශ්චිත කාලසීමාවක් තුළ අපේක්ෂිත සංවර්ධන ප්‍රතිඵලය සාධනය සඳහා වූ වැඩ පිළිවෙළකි.

(2) රාජ්‍ය හා පෞද්ගලික අංශවල දායකත්වයෙන් සිදුවන දිගුකාලීන සංවර්ධන ක්‍රියාවලියකි.

(3) රටක් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයකි.

(4) දේශීය විදේශීය වශයෙන් සංවර්ධනය සඳහා සිදුවන විශාල මුදල් ආයෝජනයකි.

(5) සියලු පුරවැසියන් ඉලක්ක කරගත් සමාජ සංවර්ධන හා සමාජ ප්‍රවර්ධන ක්‍රියාවලියකි

17 කිසියම් තොරතුරක් පිළිබඳ විෂය මූලික ව මෙන් ම විශ්ලේෂණාත්මක ව විග්‍රහයක් ලබාදීම හඳුන්වන්නේ,

(1) තොරතුරු වාර්තාකරණය ලෙසයි.

(2) දොරටුපාලනය ලෙසයි.

(3) මාධ්‍ය හිමිකාරීත්වය ලෙසයි.

(4) විචාරය ලෙසයි.

(5) සංස්කරණය ලෙසයි.

18 ශ්‍රී ලංකාවේ පුවත්පත් කර්මාන්තය නියාමනය සඳහා ඇති ව්‍යවස්ථාපිත නියාමන ආයතනයක් වන්නේ මින් කවරක්ද?

(1) ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම

(2) නිදහස් මාධ්‍ය ව්‍යාපාරය

(3) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය

(4) ශ්‍රී ලංකා කර්තෘ සංසදය

(5) ශ්‍රී ලංකා වෘත්තීය පුවත්පත් කලාවේදීන්ගේ සංගමය

19 වාණිජ අරමුණු මත පදනම් වූ, සුලබ වූ, බහුතර ජනතාවගේ පරිභෝජනය සඳහා මහා පරිමාණයෙන් නිපදවනු ලබන සංස්කෘතික ප්‍රභේදය කුමක්ද?

(1) සම්භාව්‍ය සංස්කෘතිය

(2) සාම්ප්‍රදායික සංස්කෘතිය

(3) ජන සංස්කෘතිය

(4) ග්‍රාමීය සංස්කෘතිය

(5) ජනප්‍රිය සංස්කෘතිය

20 පහත කරුණු අධ්‍යයනය කරන්න.

A - අධ්‍යාපනික මාධ්‍යයක් ලෙස ආරම්භ විය.
B - ටෙලිග්‍රාෆ් තාක්ෂණ වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස බිහිවිය.
C - දුරකථනය හා අන්තර්ජාලය ඔස්සේ බිහි විය.
D - ලෝක යුද්ධ සමයේ දී ප්‍රචාරණ මාධ්‍යයක් ලෙස ක්‍රියාත්මක විය.

ඉහත කරුණු පිළිවෙළින් ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

(1) ගුවන්විදුලි මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය, සිනමා මාධ්‍ය හා නව මාධ්‍යයයි.

(2) ගුවන්විදුලි මාධ්‍ය, නව මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය හා සිනමා මාධ්‍යයයි.

(3) රූපවාහිනී මාධ්‍ය, ගුවන්විදුලි මාධ්‍ය, නව මාධ්‍ය හා සිනමා මාධ්‍යයයි.

(4) සිනමා මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය, ගුවන්විදුලි මාධ්‍ය හා නව මාධ්‍යයයි.

(5) නව මාධ්‍ය, රූපවාහිනී මාධ්‍ය, සිනමා මාධ්‍ය හා ගුවන්විදුලි මාධ්‍යයයි.

21 සන්නිවේදන ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| A - ෆෙඩරල් සන්නිවේදන කොමිසන් සභාව (FCC) | P - අන්තර්ජාතික සබඳතා තහවුරු කිරීමට ප්‍රතිපත්ති සැකසීම |
| B - කොස්තාරිකා සම්මන්ත්‍රණය | Q - ජනමාධ්‍ය ආයතන අතර තාක්ෂණික ගැටළු නියාමනය |
| C - යුනෙස්කෝව | R - ගෝලීය මාධ්‍ය නිරූපණය වඩාත් සාධාරණීකරණය කිරීම |
| D - මැක්බ්‍රයිඩ් කොමිසම | S - සන්නිවේදන ප්‍රතිපත්ති අසමානතා දුරු කිරීම සඳහා සකස් විය යුතු වීම |

ඉහත කරුණු අතරින් නිවැරදි ගැලපීම තෝරන්න.

(1) AQ, BR, CS, DP

(2) AP, BQ, CR, DS

(3) AR, BP, CQ, DS

(4) AQ, BP, CS, DR

(5) AS, BR, CQ, DP

22 වර්තමාන මාධ්‍ය සමාජයේ අන්තර්ජාලය සහ ඩිජිටල් තාක්ෂණය ඔස්සේ බිහි වූ 'අතථ්‍ය සන්නිවේදනයේ' ප්‍රධාන ලක්ෂණයක් නො වන්නේ,

(1) අඩු පිරිවැය සහ කාර්යක්ෂමතාවයි.

(2) කාලය සහ අවකාශය පිළිබඳ භෞතික සීමා නොමැති වීමයි.

(3) සන්නිවේදකයා සහ ග්‍රාහකයා මුහුණට මුහුණ හමුවීම අනිවාර්ය වීමයි.

(4) ශ්‍රව්‍ය දෘශ්‍ය අංග සහිතව සන්නිවේදනයේ යෙදිය හැකි වීමයි.

(5) එකවර විශාල පිරිසක් සමඟ සන්නිවේදනය කළ හැකි වීමයි.

23 මාධ්‍ය සාක්ෂරතාවයේ දී 'ස්ව-කේන්ද්‍රය' යන්නෙන් අදහස් වන්නේ,

(1) මාධ්‍ය පණිවිඩ නිර්මාණය කිරීමට ඇති හැකියාවයි.

(2) මාධ්‍ය ආයතන වල ආර්ථික ව්‍යුහය අවබෝධ කරගැනීමේ හැකියාවයි.

(3) රූපවාහිනී වැඩසටහන් විචාරය කිරීමට ඇති හැකියාවයි.

(4) සියලුම මාධ්‍ය පණිවිඩ එකලෙස විශ්වාස කිරීමයි.

(5) තමන්ගේ අරමුණු සහ ඉලක්ක මත පදනම්ව, තොරතුරු තෝරා බේරා ගනිමින් මාධ්‍ය පරිහරණය කිරීමේ හැකියාවයි.

24 අන්‍යෝන්‍ය අවබෝධය සහ ගෞරවය ඇති කිරීමේ වුවමනාව වඩාත් හොඳින් ඉස්මතු වන ආකෘතිය වන්නේ,

(1) පුවත් නියෝජිත/ප්‍රචාරණ ආකෘතිය (2) මහජන තොරතුරු ආකෘතිය (3) ද්විමාර්ගික අසමමිතික ආකෘතිය

(4) ද්විමාර්ගික සමමිතික ආකෘතිය (5) ඒකමාර්ගික සමමිතික ආකෘතිය

25 මාධ්‍ය අභිසාරිතාව යන්නෙන් අදහස් වන්නේ,

(1) කුඩා ග්‍රාහක කණ්ඩායම් ඉලක්ක කර මාධ්‍ය වෙන් වෙන්ව ක්‍රියාත්මක වීමයි.

(2) සමාජ මාධ්‍ය භාවිතය නියාමනය කිරීමයි.

(3) මාධ්‍ය ආයතනවල අයිතිය රජයට පවරා ගැනීමයි.

(4) මාධ්‍ය ඔස්සේ පාරිභෝගික භාණ්ඩ ප්‍රවර්ධනය කිරීමයි.

(5) අන්තර්ජාල තාක්ෂණය පදනම් කරගෙන සියලු ම මාධ්‍ය එකම සංඛ්‍යාංක වේදිකාවකට ඒකරාශී වීමයි.

26 සිසුන් පිරිසක් ළඟ එන විභාගයට අදාළ කරුණු කිහිපයක් සාකච්ඡා කරයි.

කවිරු : ඔව්. ඒ කියන්නේ වෘත්තීය සන්නිවේදකයන් ඉන්නවා කියන එකයි.

ගිම්හානි : තාක්ෂණික මෙවලම් භාවිත කරනවා.

රාධා : බහුවිධ ග්‍රාහකත්වයකින් යුක්තයි.

කවිරු : සන්දේශ දොරටුපාලන ක්‍රියාවලියකට යටත් වෙනවා.

මෙම පිරිස සාකච්ඡා කරනු ලබන්නේ,

(1) සමූහ සන්නිවේදනයේ ලක්ෂණ පිළිබඳවයි. (2) ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ පිළිබඳවයි.

(3) රූපවාහිනී මාධ්‍යයේ ලක්ෂණ පිළිබඳවයි. (4) ජනමාධ්‍යයේ ලක්ෂණ පිළිබඳවයි.

(5) ලැස්වෙල් ආකෘතියේ ලක්ෂණ පිළිබඳවයි.

27 ප්‍රශ්නාවලියක් සකස් කිරීමේ දී අනුගමනය **නොකළ** යුතු ක්‍රමවේදයක් වන්නේ මින් කුමක්ද?

(1) සරල භාෂාවක් භාවිත කිරීම (2) පක්ෂපාතී පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීම

(3) ප්‍රමුඛතාව අනුව ප්‍රශ්න පෙළගැස්වීම (4) ව්‍යාකූල නොවන කෙටි ප්‍රශ්න ඇසීම

(5) අරමුණට ගැළපෙන ප්‍රශ්න පමණක් ඇතුළත් කිරීම

28 ‘බුද්ධිමය දේපළ පනත’ මගින් ආරක්ෂා කරන ‘සාධාරණ භාවිතය’ යන්නෙන් අදහස් වන්නේ,

(1) ඕනෑම කෙනෙකුගේ නිර්මාණයක් තමන්ගේ නමින් පළ කිරීමට ඇති අයිතියයි.

(2) බුද්ධිමය දේපළ සඳහා මුදල් අයකිරීම තහනම් කිරීමයි.

(3) අන්තර්ජාලයෙන් බාගත කරන ඕනෑම දෙයක් විකිණීමට ඇති අයිතියයි

(4) හිමිකම් උල්ලංඝනය කිරීමක් නොවන පරිදි විවේචන, ප්‍රවෘත්ති වාර්තාකරණය, ඉගැන්වීම හෝ පර්යේෂණ සඳහා යම් නිර්මාණයක් උපුටා ගැනීමයි.

(5) වාණිජ අරමුණු මුදුන්පත් කරගැනීම වෙනුවෙන් වෙනත් අයෙකුගේ නිර්මාණයක් මුදල් නොගෙවා කිරීම හා ලාභ ඉපැයීමට ඇති අවස්ථාවයි.

29 ගෝලීයකරණය හේතුවෙන් තුන්වන ලෝකයේ රටවල සංස්කෘතීන්ට එල්ල වී ඇති ප්‍රබල අභියෝගය වන්නේ,

(1) දේශීය සංස්කෘතීන් ලොව පුරා ප්‍රචලිත වී, ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත් වීමයි.

(2) දේශීය සංස්කෘතික අනන්‍යතාවන් යටපත් කර දැමීම යි.

(3) සියලුම රටවල සංස්කෘතීන් එකම මට්ටමකට වර්ධනය වීම යි.

(4) සංස්කෘතික කම්පනයක් ඇති නොවී අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය වීම යි.

(5) තාක්ෂණය නිසා දේශීය සංස්කෘතික අංග භාවිතය ඉහළ යාම යි.

30 ‘අන්තර් සංස්කෘතික සන්නිවේදනය’ අධ්‍යයනය කිරීම වර්තමානයේ වැදගත් වන්නේ,

(1) වෙනත් සංස්කෘතීන් සමඟ සහජීවනය ගොඩනැගීමටයි.

(2) සංස්කෘතික සහවේදනය සමාජගත කිරීමටයි.

(3) විදේශීය භාෂා ඉගෙනීම අනිවාර්ය කිරීමටයි.

(4) තමන්ගේ සංස්කෘතිය අනෙක් සංස්කෘතීන්ට වඩා උසස් යැයි පෙන්වීමටයි.

(5) සියලුම ජාතීන්ගේ සංස්කෘතීන් ඒකරාශී කර, එකම ලෝක සංස්කෘතියක් නිර්මාණය කිරීමටයි.

31 “නන්දාගේ දෙනෙතින් කඳුළු වැටෙයි. ඇය සාලයේ කුළුණ ට හේත්තු වී සිය අත්ලෙන් කඳුළු පිස දමයි. මාතර හාමිනේ සාලයේ පුටුවක වාඩි වී පියල් නික්ම යන අයුරු බලා සිටියි. දුම්රිය මාර්ගයේ දුම්රියක් ශබ්ද නගමින් ඈතින් ඈතට ගමන් කරයි.” මෙම සිදුවීමට අදාළ රූප රාමු පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) අති සමීප රූපයක්, අති දූර රූපයක්, මධ්‍යම රූපයක්, මධ්‍යම සමීප රූපයක්

(2) අති දූර රූපයක්, මධ්‍යම රූපයක්, සමීප රූපයක්, අති සමීප රූපයක්

(3) අති සමීප රූපයක්, සමීප රූපයක්, මධ්‍යම සමීප රූපයක්, අති දූර රූපයක්

(4) සමීප රූපයක්, මධ්‍යම රූපයක්, අති දූර රූපයක්, අති සමීප රූපයක්

(5) අති සමීප රූපයක්, අති දූර රූපයක්, මධ්‍යම සමීප රූපයක්, මධ්‍යම රූපයක්

32 වර්තමාන මාධ්‍ය සමාජය තුළ 'නිර්මහාපරිමාණකරණය' යනුවෙන් හැඳින්වෙන ප්‍රවණතාවයේ ලක්ෂණයක් වන්නේ,

(1) මුළු රටට ම එකම පුවත්පතක් මුද්‍රණය කිරීමයි.

(2) සියලුම ග්‍රාහකයින් එකම රූපවාහිනී නාලිකාවක් නැරඹීමයි.

(3) ජාත්‍යන්තර මාධ්‍ය ජාලා ඒකාධිකාරයක් ගොඩනැගීමයි.

(4) ග්‍රාහකයින් මාධ්‍ය භාවිතයෙන් ඈත් වීමයි.

(5) නිශ්චිත, ඉලක්කගත කුඩා කණ්ඩායම් වෙත සන්දේශ යොමු කිරීමයි.

33 ඓතිහාසික සිනමා ජවනිකාවක් ක්ෂණික ව සකසා ගැනීමට යොදාගත හැකි නව තාක්ෂණික ප්‍රවණතාව වන්නේ,

(1) වලාකුළු පරිගණක තාක්ෂණයයි. (Cloud Computing)

(2) කෘතිම බුද්ධියයි. (Artificial Intelligence)

(3) අතථ්‍ය යථාර්ථයයි. (Virtual Reality)

(4) සංවේදක ජාලයි. (Sensor networks)

(5) නැනෝ තාක්ෂණයයි. (Nano Technology)

34 සන්නිවේදන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A- ඊ මේල් පණිවිඩ යැවීම හා ලැබීම B - දුරකථන කෙටි පණිවිඩ හුවමාරුව

C - සමාජ ජාල වෙබ් අඩවි පරිශීලනය D - මාර්ගගත කතාබහ

E - වීඩියෝ සම්මන්ත්‍රණ

මේ අතරින්,

(1) A B C D E යන සියල්ල අතථ්‍ය සන්නිවේදනයට අයත් වේ.

(2) D E අතථ්‍ය සන්නිවේදනයක් වන අතර, A B C යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් වේ.

(3) C D E අතථ්‍ය සන්නිවේදනයක් වන අතර, A B යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් වේ.

(4) A C D E අතථ්‍ය සන්නිවේදනයක් වන අතර, B යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් වේ.

(5) B C D E අතථ්‍ය සන්නිවේදනයට අයත් වන අතර, A යන්ත්‍ර සහායක පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් - වේ.

35 සිරිසෙතගම මහජන සෞඛ්‍ය නිලධාරියා ගේ ප්‍රධානත්වයෙන් ජනතාවගේ සෞඛ්‍ය, සනීපාරක්ෂක කටයුතු හා පෝෂණය ප්‍රවර්ධනය කිරීමට මාධ්‍ය උපයෝගී කරගනිමින් වැඩසටහනක් ක්‍රියාත්මක කළේය. සංවර්ධනය සඳහා සන්නිවේදන සංකල්පයේ දී මෙය අයත් වන්නේ,

(1) ස්වයං නිර්ණයටයි. (2) අවශ්‍යතා කේන්ද්‍රීයත්වයටයි. (3) සහභාගීත්ව ප්‍රජාතන්ත්‍රවාදයටයි.

(4) ස්වයං විශ්වාසයටයි. (5) යහපත් පරිසරයක් ගොඩනැගීමටයි.

36 දිනෙන් දින උණුසුම් වන මැදපෙරදිග යුධ ගැටුම් තත්ත්වය පිළිබඳ විවිධ මාධ්‍ය විවිධාකාරයෙන් වාර්තා කරමින් සිටියි. නිවැරදි තොරතුරු තෝරා බේරා ගෙන පරිහරණය කිරීමට වඩාත් අවශ්‍ය වන්නේ,

(1) අත්දැකීම් පසුතලයයි. (2) ප්‍රතිභාවයි (3) විචාරශීලී ග්‍රාහකත්වයයි.

(4) පරිකල්පනයයි. (5) සංජානනයයි.

37 නව මාධ්‍ය සතු ලක්ෂණ කිහිපයක් හා ඒවායෙහි සරල අර්ථය පහත දක්වා ඇත.

A - 1. වේගවත් සන්දේශකරණය

2. පූර්ව උපදෙස් මත සක්‍රිය වන මානව මැදිහත්වීමකින් තොර ක්‍රියාවලියකි.

B – 1. අන්තර් ක්‍රියාකාරීත්වය

2. ද්වි මාර්ගික ව සිදුවන සන්නිවේදන ක්‍රියාවලියක් වන අතර, ඒ තුළින් ක්ෂණික ව තොරතුරු යාවත්කාලීන කරයි.

C – 1. දත්ත සංචිතකරණය

2. අතිශය වේගයෙන් දත්ත හුවමාරු කෙරේ.

D – 1. අධිපාඨනීයත්වය

2. විද්‍යුත් සබඳතා භාවිත කරමින් එක් පයිතයක් මගින් තවත් පයිතයක් වෙත ළඟාවීමයි.

E - 1. මූලික දත්ත එකතුවකි.

2. ස්වයංකරණය

ඉහත ප්‍රකාශ අතර සබඳතාව නිවැරදි ව දක්වන යුගලය තෝරන්න.

(1) A C හා D පමණි. (2) B හා D පමණි. (3) E හා C පමණි.

(4) B C D පමණි. (5) ඉහත සියල්ල ම නිවැරදි ය.

38 සිද්ධි කළමනාකරණයේ අවශ්‍යතාව හා වැදගත් කමකි.

(1) අර්බුදකාරී තත්ත්ව කළමනාකරණය කිරීම
(2) මාධ්‍ය ආචාර ධර්ම අනුගමනය කිරීම
(3) ප්‍රශස්ත ලෙස ග්‍රාහකයා ඇමතීමේ කුසලතාව
(4) නව භාණ්ඩ හෝ සේවා හඳුන්වාදීම
(5) ඉදිරිපත් කිරීමේ කුසලතා වර්ධනය කිරීම

39 මාධ්‍ය ස්ථාවර ව පවත්වා ගෙන යාමට එහි ආර්ථිකමය බලපෑම ශක්තිමත් කිරීම පිළිබඳ ව කියැවෙන මාධ්‍ය ප්‍රවණතාවය වන්නේ,

(1) නිර්නියාමනයයි.
(2) පරිභෝජ්‍යකරණයයි.
(3) නිර්මහාපරිමාණකරණයයි.
(4) ගෝලීයකරණයයි.
(5) වාණිජකරණයයි.

40 ඵලදායී සන්දේශයක් සඳහා අවශ්‍ය වන ප්‍රධාන ගුණාංග හතර වන්නේ,

(1) ඇලීම, ව්‍යුහය, පක්ෂපාතීත්වය හා සරල බවයි.
(2) සරල බව, විකෘතිකරණය, ව්‍යුහය හා ඇලීමයි.
(3) පක්ෂපාතීත්වය, විකෘතිකරණය, ඒකාකෘතිකබව හා විශේෂත්වයයි.
(4) සරල බව, විශේෂත්වය, ව්‍යුහය හා ඇලීමයි.
(5) ඒකාකෘතික බව, සරල බව, විශේෂත්වය හා ඇලීමයි.

41 මාධ්‍ය ප්‍රවණතා පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) නව මාධ්‍ය දියුණුවට බලපාන්නේ අන්තර්ජාල තාක්ෂණයයි.
(2) මානව සන්නිවේදන උවමනා ඉටුකර ගැනීමට අන්තර්ජාල වස්තු මගින් අවස්ථාව ලැබෙයි.
(3) මාධ්‍ය බෙදාහැරීම යන්න ප්‍රවේශ (Access) බවට පත් ව තිබීමෙන් ඉතා ඉක්මනින් සන්දේශවලට ළඟා වීමේ හැකියාව ලැබෙයි.
(4) ඒක මාධ්‍යවලින් (Mono Media) බහු මාධ්‍යවලට (Multi media) පැමිණීම මගින් සන්නිවේදන ක්ෂේත්‍රය වඩාත් පුළුල් වෙයි.
(5) ප්‍රතිසම (Analog) තාක්ෂණයේ දියුණුවත් සමග මාධ්‍ය නාලිකා අධිවේගී පුළුල් කලාපයකට එළැඹෙයි.

42 රූපවාහිනී නිවේදකයෙක් අධික වැසි තත්ත්වය හමුවේ කැලණි ගඟේ ජල මට්ටම ඉහළ ගොස් ඇති බැවින් ගඟ දෙ පස සිටින ජනතාවට ආරක්ෂිත ව සිටින ලෙස සජීවී ව වාර්තා කළේය. වැසි තත්ත්වය හේතුවෙන් නිවේදකයාගේ හඬ අපැහැදිලි විය. මෙහි ඇතුළත් සන්නිවේදන මූලිකාංග වන්නේ,

(1) සන්නිවේදකයා, සන්දේශය, අත්දැකීම් පසුතලය, හා බලපෑම යන්න ය.
(2) සන්නිවේදකයා, සන්දේශය, නාලිකාව හා ඝෝෂාවයි.
(3) ග්‍රාහකයා, ප්‍රතිපෝෂණය, අත්දැකීම් පසුතලය, විකේතකරණයයි.
(4) නාලිකාව, ග්‍රාහකයා, සන්දේශය හා ප්‍රතිපෝෂණයයි.
(5) ප්‍රතිපෝෂණය, ඝෝෂා, ආකේතකරණය හා සන්දේශයයි.

43 නිර්මාණාත්මක චින්තන ක්‍රියාවලිය පිළිබඳව ග්‍රැහැම් වොලස් (Graham Wallas) විසින් ඉදිරිපත් කළ අදියර හතර පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) පෝෂණය, සකස් කිරීම, සත්‍යාපනය, ප්‍රදීපනය
(2) ප්‍රදීපනය, පෝෂණය, සකස් කිරීම, සත්‍යාපනය
(3) සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය, සත්‍යාපනය
(4) සත්‍යාපනය, සකස් කිරීම, ප්‍රදීපනය, පෝෂණය
(5) සකස් කිරීම, ප්‍රදීපනය, පෝෂණය, සත්‍යාපනය

44 සංවර්ධන සංකල්පයක් ලෙස ‘ප්‍රදේශීයකරණය’ යන්නෙන් අදහස් වන්නේ,

(1) විදේශීය සම්පත් පමණක් යොදාගෙන සංවර්ධනය සිදු කිරීමයි.

(2) ගෝලීයකරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවලට ආදේශ කිරීමයි.

(3) සංවර්ධනය රටේ හෝ ප්‍රදේශයේ සමාජ, ආර්ථික, සංස්කෘතික ලක්ෂණ මත පදනම්ව ප්‍රජාව විසින් ම සිදු කිරීමයි.

(4) නාගරික ජනතාව ගම්මානවලට ගෙනගොස් පදිංචි කරවීමයි.

(5) රජයේ ඉහළ නිලධාරීන් පමණක් තීරණ ගැනීමයි.

45 සම්භාව්‍ය සංස්කෘතිය ජනප්‍රිය සංස්කෘතියෙන් වෙනස් වන මූලික ලක්ෂණය වන්නේ,

(1) සම්භාව්‍ය සංස්කෘතිය ඩිජිටල් මාධ්‍ය හරහා පමණක් ව්‍යාප්ත වීමයි.

(2) සම්භාව්‍ය සංස්කෘතියට කිසිදු ඓතිහාසික පසුබිමක් නොමැති වීමයි.

(3) සම්භාව්‍ය සංස්කෘතිය වාණිජ අරමුණු පෙරදැරිව මහා පරිමාණයෙන් නිෂ්පාදනය වීමයි.

(4) සම්භාව්‍ය සංස්කෘතිය බහුතර සාමාන්‍ය ජනයාගේ එදිනෙදා විනෝදාස්වාදය සඳහා බිහිවීමයි.

(5) සම්භාව්‍ය සංස්කෘතිය උසස් බුද්ධිමය, සෞන්දර්යාත්මක සහ සදාචාරාත්මක අගයකින් යුක්ත වීමයි.

46 ප්‍රතිපෝෂණය යන්න වඩාත් හොඳින් නිර්වචනය වන වරණය තෝරන්න.

(1) සන්නිවේදකයා වෙත ලබාදෙන ප්‍රතිචාරයයි.

(2) ග්‍රාහකයා විසින් ලබාදෙන ප්‍රතිචාරයයි.

(3) සන්නිවේදන ක්‍රියාවලියේ ගුණාත්මක බව ඉහළ නංවාලන සංකල්පයයි.

(4) සන්නිවේදකයා වෙත ලබාදෙන හඳුනාගත හැකි ආකාරයේ ප්‍රතිචාරයයි.

(5) ග්‍රාහකයා වෙත සාර්ථක ව යම් තොරතුරක් ඉදිරිපත් කිරීමයි.

47 සන්නිවේදනය අත්‍යවශ්‍ය මානවීය ක්‍රියාවලියක් වන්නේ,

(1) පුද්ගල අන්තර් සබඳතා ගොඩනැගීම සඳහා ය. (2) විධාන ලබාදීම සඳහා ය.

(3) තොරතුරු හුවමාරුව සඳහා ය. (4) පෙළඹවීම සඳහා ය.

(5) මූලික අවශ්‍යතා පූරණය කරගැනීම සඳහා ය.

48 “එදිනෙදා ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත, යම් නිශ්චිත කාල වකවානුවක අඛණ්ඩ ව ප්‍රකාශයට පත්කරන, එකට නොබඳින ලද මුද්‍රිත ප්‍රකාශනයයි.” පුවත්පත පිළිබඳ ඉහත නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) සුමංගල ශබ්ද කෝෂයයි. (2) සන්නිවේදන ශබ්දාකරයයි.

(3) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂයයි. (4) යුනෙස්කෝ සංවිධානයයි.

(5) ජනසන්නිවේදන අවබෝධයයි.

49 හිමාෂි ක්ෂේත්‍රයට ගොස් තමා විසින් ම ප්‍රශ්නාවලි හෝ සම්මුඛ සාකච්ඡා මගින් දත්ත රැස්කරයි. එම දත්ත,

(1) ද්විතීයික දත්ත වේ. (2) ප්‍රමාණාත්මක දත්ත වේ. (3) ප්‍රාථමික දත්ත වේ.

(4) ගුණාත්මක දත්ත වේ. (5) සංඛ්‍යාත්මක දත්ත වේ.

50 මාධ්‍යයේ අහිතකර බලපෑමෙන් ළමා හා තරුණ පරපුර මුදා ගත යුතු බව අවධාරණය කරන ලියවිල්ල වනුයේ,

(1) පැරිස් න්‍යාය පත්‍රය යි. (2)‘Many voices one world’ කෘතියයි.

(3) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි. (4) ශෘන්වල්ට් ප්‍රකාශනයයි.

(5) පෙන්සිල්වේනියානු විශ්ව විද්‍යාල පර්යේෂණ වාර්තාවයි.

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர) உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv.Level) Supportive Assessment, 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **II**
தொடர்பாடலும் ஊடகக் கற்கையும் **II**
Communication and Media Studies **II**

**29** **II** **S**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time -10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

උපදෙස්:
❖ ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව 40 කි.

1 "ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය සමාජ ඵලදායීතාව වර්ධනයට හේතු වේ."

(i) රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ජනසන්නිවේදනයේ ප්‍රයෝජන **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) සමාජ මාධ්‍ය යෙදවුම් **තුනක්** උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ආපදා තත්ත්වයක් කළමනාකරණය කිරීමේ දී ජනමාධ්‍ය විසින් ඉටුකළ යුතු කාර්යයන් **හතරක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 16)

2 "මාධ්‍ය මගින් ගලා එන තොරතුරු විශ්ලේෂණය කර ඒවායේ ගුණාත්මකභාවය පිරික්සීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ."

(i) සන්දේශයක් තුළ අන්තර්ගත තොරතුරු වර්ග **දෙක** නම් කරන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය සාක්ෂරතාව, මාන **දෙකක්** ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ඵලදායී සන්දේශයක අඩංගු විය යුතු ප්‍රධාන ගුණාංග **හතරක්** නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 16)

3 "කියවීම සන්නිවේදන ශක්‍යතා වැඩි දියුණු කරයි."

(i) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී භාෂාව ප්‍රබල ලෙස නිරූපණය වන මුද්‍රිත සාහිත්‍ය කෘති වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) කථන සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු **දෙකක්** සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විද්‍යාලයීය කලා උළෙලේ ප්‍රචාරණ කටයුතු සඳහා අතථ්‍ය සන්නිවේදනය යොදාගත හැකි ආකාර **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) පුවත්පතක දැකිය හැකි නිර්මාණාත්මක අංග **හතරක්** නම් කොට විස්තර කරන්න. (ලකුණු 16)

4 “සමාජයීය සත්ත්වයෙකු ලෙස සන්නිවේදන කාර්යයේ දී පුද්ගලයාට තොරතුරු ඉතා වැදගත් වේ.”

(i) තොරතුරු රැස්කිරීම සඳහා සමීක්ෂණයක දී භාවිත කරනු ලබන විධි ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) සන්නිවේදනයේ ස්වරූපයක් වන රූපණයේ කුසලතා වර්ධනයට හේතුවන කරුණු **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය මගින් දක්වන ප්‍රධාන කොටස් හා සමාන වන සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **තුනක්** නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා පහත සඳහන් සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම රූපවාහිනී මාධ්‍යයේ දී යොදාගත හැකි ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(අ) **ජන කවි** (ආ) **ගැමි නාටක** (ලකුණු 16)

5 “සන්නිවේදනය, මාධ්‍ය සහ සංස්කෘතිය, එකිනෙකට අන්තර් සම්බන්ධිත සංකල්ප ත්‍රිත්වය කි.”

(i) සන්නිවේදනය පිළිබඳ චාල්ස් එච්. කූලිගේ නිර්වචනයේ සඳහන් වන කරුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) විද්‍යුත් මාධ්‍යයක් ලෙස ගුවන්විදුලි මාධ්‍යයේ මූලික ලක්ෂණ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) රටක මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අන්තර්ගත විය යුතු පහත සඳහන් කරුණු **තුන** පැහැදිලි කරන්න.

(අ) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරිත්වය

(ආ) තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික වර්ධනය

(ඉ) මාධ්‍ය අධිකාරීන් හා වෙළෙඳ පොළ නියාමනය (ලකුණු 12)

(iv) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ **හතරක්** නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 16)

6 (i) සිනමාවේ නිර්මාණාත්මක ප්‍රවේශ **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) පහත දැක්වෙන මාධ්‍ය නියාමන ආයතන දෙක පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

(ආ) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය (ලකුණු 08)

(iii) නිර්මාණකරුවෙකුට අත්දැකීම් ලැබෙන ප්‍රමුඛ ක්‍රම **තුනක්** නිදසුන් සහිත ව විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි නව ප්‍රවණතා පහත දැක්වේ. වත්මන් මාධ්‍ය සන්දර්භයෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(අ) සරල භාෂා භාවිතය

(ආ) වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ යාම

(ඉ) ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම

(ඊ) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම (ලකුණු 16)

7 වෙජි ඇග්‍රෝ (Vegi Agro) ආයතනය ප්‍රදේශවාසීන්ගේ ජීවන ක්‍රමය නංවාලමින් පාරිභෝගිකයන්ට නැවුම් එළවළු හා පළතුරු ලබාදීමේ සංවර්ධන ව්‍යාපෘතියක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

(i) සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය සම්බන්ධයෙන් සිල්වියෝ වයිස්බෝඩ් ඉදිරිපත් කළ ප්‍රධාන කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) වෙජි ඇග්‍රෝ ආයතනයට මහජන සම්බන්ධතා අවශ්‍ය වන අවස්ථා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ව්‍යාපාර මහජන සම්බන්ධතා යටතේ භාවිත කළ හැකි මහජන සම්බන්ධතා උපක්‍රම **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) මෙම සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථක කර ගැනීම සඳහා ඉවහල් වන සමූහ සන්නිවේදන විධික්‍රම **හතරක්** උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 16)

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
fy;tp, cau; fy;tp kw;Wk; njhopw; fy;tp mikr;R
**Ministry of Education, Higher Education and Vocational Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (cau;தர) ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv.Level) Examination, 2026

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය **I**
njhlu;ghlYk; Clff; fw;ifAk; **I**
Communication and Media Studies **I**

**29** **S** **I**

පැය දෙකයි
,uz;L kzpj;jpahyk
Two hours

## පිළිතුරු පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1. | 2 | 11. | 1 | 21. | 4 | 31. | 3 | 41. | 4/5 |
| 2. | 2 | 12. | 3 | 22. | 3 | 32. | 5 | 42. | 2 |
| 3. | 4 | 13. | 5 | 23. | 5 | 33. | 2 | 43. | 3 |
| 4. | 2 | 14. | 2 | 24. | 4 | 34. | 4 | 44. | 3 |
| 5. | 3 | 15. | 4 | 25. | 5 | 35. | 2 | 45. | 5 |
| 6. | 2 | 16. | 1 | 26. | 4 | 36. | 3 | 46. | 4 |
| 7. | 3 | 17. | 4 | 27. | 2 | 37. | 2 | 47. | 1 |
| 8. | 5 | 18. | 3 | 28. | 4 | 38. | 1 | 48. | 4 |
| 9. | 3 | 19. | 5 | 29. | 2 | 39. | 5 | 49. | 3 |
| 10. | 4 | 20. | 3 | 30. | 1 | 40. | 4 | 50. | 4 |

එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 01x50=50

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026

**විෂය අංකය - 29** **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**

---

### පිළිතුරු පත්‍රය II

1 ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය සමාජ ඵලදායීතාව වර්ධනයට හේතු වේ.

(i) රූපවාහිනී මාධ්‍යයේ මූලික ලක්ෂණ හතරක් නම් කරන්න.

- ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යකි.
- විවිධාකාර අන්තර්ගතයන්ගෙන් සහ විචිත්‍රවත් ආකෘතිවලින් සමන්විත ය.
- පෞද්ගලික ගෘහස්ථ සමීපතාවකින් යුක්තය.
- ආකර්ෂණීය මාධ්‍යයකි.
- පුද්ගලයාගේ පූර්ණ අවධානය ග්‍රහණය කරගන්නා මාධ්‍යකි.
- සංකීර්ණ තාක්ෂණයක් සහිත ය.
- විධිමත් ආයතනගත සංවිධාන ව්‍යුහයකින් සමන්විත ය.
- ජාතික ජාත්‍යන්තර ලක්ෂණවලින් යුක්තය. (ලකුණු 04)

(ii) ජනසන්නිවේදනයේ ප්‍රයෝජන දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

1. ප්‍රජානනය (දැනුම ලබා ගැනීම)
2. අපසරණය (විකල්ප වෙත යොමු කිරීම)
3. සමාජ උපයෝගීතාව
4. නිශ්කර්ෂණය (පුද්ගලයන්ගෙන් හා කාර්යයන්ගෙන් ඉවත් වී සිටීම) (ලකුණු 08)

(iii) සමාජ මාධ්‍ය යෙදවුම් තුනක් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

| | | | |
|---|---|---|---|
| Facebook | Twitter | LinkedIn | Pinterest |
| Instagram | Skype | Viber | WhatsApp |

(ලකුණු 12)

(iv) ආපදා තත්ත්වයක් කළමනාකරණය කිරීමේ දී ජනමාධ්‍ය විසින් ඉටුකළ යුතු කාර්යයන් හතරක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

- **සුපරීක්ෂණය**

සාමාජය තුළ ජීවත්වන පුද්ගලයා දැන ගත යුතු තොරතුරු එක් රැස් කිරීම මෙන් ම ආරක්ෂණ තොරතුරු පිළිබඳ දැනුවත් කිරීම, සමාජීය අවශ්‍යතා, ආපදා තොරතුරු එක්රැස් කිරීම සහ කඩිනමින් ඒවා පිළිබඳ සමාජය දැනුවත් කිරීම ආදිය සුපරීක්ෂණය යන්නට ඇතුළත් වේ.

- **අර්ථකථනය**

විවිධ සිද්ධීන් සහ තොරතුරුවල අර්ථ පැහැදිලි කිරීම, විවරණය කිරීම සහ අදාළ සමාජීය ප්‍රතිචාර ලබා ගනිමින් තොරතුරු විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම යනාදිය මෙයට ඇතුළත්වේ.

- **සහසම්බන්ධය**

ජනමාධ්‍ය සන්දේශ මඟින් පුද්ගලයන් සහ ආයතන අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාව ගොඩනැඟීම ප්‍රධාන වශයෙන් මෙයින් අදහස් කෙරේ. සමාජ ස්ථායිතාව පවත්වා ගෙන යාම සඳහා ජනමාධ්‍යයේ සහසම්බන්ධතා කාර්යය උපකාර වේ.

- **සමාජානුයෝජනය**

පුද්ගලයා සමාජයට අනුගත ව හැසිරීම පිළිබඳ ඉගෙනුම, සමාජය පිළිබඳ දැනුම සහවටිනාකම් ඉදිරිපත් කිරීම, ඒවා ජනතාව වෙත ලබා දීම හා සමාජයේ පොදු ගැටලු හා අභියෝග හඳුනා ගැනීමට සැලැස්වීම ජනමාධ්‍යයේ සමාජ කාර්යයි. (ලකුණු 16)

2 මාධ්‍ය මගින් ගලා එන තොරතුරු විශ්ලේෂණය කර ඒවායේ ගුණාත්මකභාවය පිරික්සීම සඳහා මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වේ.

(i) සන්දේශයක් තුළ අන්තර්ගත තොරතුරු වර්ග දෙක නම් කරන්න.

- කරුණු ගැබ් වූ තොරතුරු සමාජයීය තොරතුරු (ලකුණු 04)

(ii) මාධ්‍ය සාක්ෂරතාව, මාන දෙකක් ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න.

සංජානන මානය චිත්තවේගී මානය

සෞන්දර්යය මානය සදාචාරාත්මක මානය (ලකුණු 08)

(iii) විචාරශීලී ග්‍රාහකයෙකු සතු විය යුතු කුසලතා තුනක් විස්තර කරන්න.

1. විශ්ලේෂණය - මාධ්‍ය සන්දේශයක අන්තර්ගත ව ඇති හෝ සංයෝග වී ඇති ද්‍රව්‍ය, අංශයන් වෙන් කිරීම

2. තක්සේරුකරණය- මාධ්‍ය සන්දේශයෙහි ගුණ හා අගුණ සොයා බලමින් තක්සේරුකරණය කිරීම

3. කාණ්ඩකරණය - මාධ්‍ය සන්දේශය කාණ්ඩවලට බෙදා වෙන් කර ගැනීම

4. අනුමානය - අනුමානය කරමින් මාධ්‍ය සන්දේශයෙහි අතුළත් දේ අනුව සිතා බලා සමස්ත රටාව පිළිබඳ අනුමාන කිරීම

5. නිගමනය - මාධ්‍ය සන්දේශයෙහි පොදු තත්ත්වයන් ඇසුරින් විශේෂිත යමක් නිගමනය කිරීම

6. සංස්ලේෂණය - මාධ්‍ය සන්දේශයෙහි සමස්තයට ගළපමින් නව ප්‍රස්තුතයක් ගොඩනැඟීම

7.වියුක්තිකරණය - මාධ්‍ය සන්දේශයෙහි හරය සහ වැදගත් කරුණු ඉතා කෙටියෙන් පැහැදිලි ලෙස දැක්වීම.

(ලකුණු 12)

(iv) ඵලදායී සංදේශයක අඩංගු විය යුතු ප්‍රධාන ගුණාංග හතරක් නිදසුන් මගින් පැහැදිලි කරන්න.

සරල බව විශේෂත්වය ව්‍යුහය ඇලීම (ලකුණු 16)

3 කියවීම සන්නිවේදන ශක්‍යතා වැඩි දියුණු කරයි.

(i) නිර්මාණාත්මක සන්නිවේදනයේ දී භාෂාව ප්‍රබල ලෙස නිරූපණය වන මුද්‍රිත සාහිත්‍ය කෘති වර්ග හතරක් නම් කරන්න.

නවකතා, කෙටිකතා, කාව්‍ය ග්‍රන්ථ,

දේශාටන සටහන්, පරිවර්තන චරිතාපදාන, (ලකුණු 04)

(ii) කථන සන්නිවේදන කුසලතා වර්ධනයට හේතුවන කරුණු දෙකක් පැහැදිලි කරන්න.

- සවන් දීම
- කියවීම
- කථන පුහුණුව
- තනි පුද්ගලයෙකුට ඇමතීම
- සමූහයක් ඇමතීම
- හඬ නගා උච්ඡාරණය කිරීම
- දක්ෂ කථිකයන්ගේ කතා අනුකරණය කිරීම
- විවිධ දේ කථනයෙන් ඉදිරිපත් කිරීම (නාට්‍ය, දෙබස්, වාර්තා කථන ආදී) (ලකුණු 08)

(iii) විද්‍යාලයීය කලා උළෙලේ ප්‍රචාරක කටයුතු සඳහා අතථ්‍ය සන්නිවේදනය යොදා ගත හැකි ආකාර තුනක් විස්තර කරන්න. (ලකුණු 12)

- කලා උළෙල පිළිබඳ ව පෝස්ටුවක් සකස්කර සමාජ මාධ්‍ය (Facebook, WhatsApp වැනි) ඔස්සේ බෙදා හැරීම
- විද්‍යුත් තැපැල ඔස්සේ පාසල්, පාසල් මාධ්‍ය සමාජ, දෙමාපියන්, ආදි සිසුන් දැනුවත් කිරීම
- කලා උළෙල පිළිබඳ වීඩියෝ සකස් කර Facebook, You tube වැනි මාධ්‍ය හරහා බෙදාහැරීම
- කලා උළෙල සඳහා විශේෂ වෙබ් පිටුවක් නිර්මාණය කිරීම

- ආකර්ශනීය ඩිජිටල් බැනර් සහ පෝස්ටර් සකස් කර සමාජ මාධ්‍ය හා වෙබ් අඩවි හරහා ප්‍රචාරය කිරීම
- Google Forms වැනි මෙවලම් භාවිත කර සහභාගී වන්නන් ගේ තොරතුරු රැස්කිරීම

(iv) පුවත්පතක දැකිය හැකි නිර්මාණාත්මක අංග හතරක් නම් කොට උදාහරණ සහිත ව විස්තර කරන්න.
කතු වැකිය, තීරු ලිපි, කෙටි කතා, චිත්‍ර කතා, විචාර, සංවාද, පාඨක අදහස්, ඡායාරූප, චිත්‍රපට වාර්තා

(ලකුණු 16)

4 සමාජයීය සත්ත්වයෙකු ලෙස සන්නිවේදන කාර්යයේ දී පුද්ගලයාට තොරතුරු ඉතා වැදගත් වේ.

(i) තොරතුරු රැස්කිරීම සඳහා සමීක්ෂණයක දී භාවිත කරනු ලබන විධි ක්‍රම දෙකක් නම් කරන්න.
ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා (ලකුණු 04)

(ii) සන්නිවේදනයේ ස්වරූපයක් වන රූපණ කුසලතා වර්ධනයට හේතු වන කරුණු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- රූපණ අවස්ථා නිරීක්ෂණය
- අනුකරණය
- විවිධ සන්නිවේදන අවස්ථා රූපණයෙන් ඉදිරිපත් කිරීම
- විවිධ අවස්ථා අනුව රූපණය වෙනස් වන ආකාරය අවබෝධ කර ගැනීම (කථිකයෙකුගේ කථාවක්, ගුරු භූමිකාව, නිවේදක භූමිකාව, රංගන ශිල්පියෙකුගේ භූමිකාව, විවාද කණ්ඩායමක සාමාජිකයන්ගේ ස්වභාවය) (ලකුණු 08)

(iii) හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ සන්නිවේදන ආකෘතිය මගින් දක්වන ප්‍රධාන කොටස් හා සමාන වන සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග තුනක් නිදසුන් දක්වමින් විස්තර කරන්න.

**සන්නිවේදකයා - who says?**

තවත් පාර්ශ්වයක් සමඟ තොරතුරු, අදහස්, මත, ආකල්ප ආදිය හුවමාරු කර ගන්නා තැනැත්තා සන්නිවේදකයා යි. පුද්ගලයෙකු පමණක් නො ව අවස්ථානුකූල ව කණ්ඩායමක්,සංවිධානයක්, ආයතනයක් වුව ද සන්නිවේදක ස්ථානය නියෝජනය කළ හැකි ය. සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ සැලකිය යුතු මට්ටමක පාලනයක් කිරීමේ හැකියාව සන්නිවේදකයා සතු වේ.

**සන්දේශය - What?**

සන්නිවේදකයා අනෙක් පාර්ශ්වය සමඟ හුවමාරු කර ගන්නා තොරතුර සන්දේශය යි. එය අදහසක්, මතයක්, ආකල්පයක් වැනි විවිධ ස්වරූපයන් ගැනීමට ඉඩ තිබේ. පණිවිඩයක් හැමවිට ම සංකේත ඇසුරින් ගොඩ නැඟේ. සංකේත යන්න වචන, ශබ්ද, වර්ණ, හැඩ රුව ආදි වශයෙන් විවිධාකාර විය හැකි ය. ඒවා තෝරා ගැනීම පරිස්සමෙන් සිදු කළ යුතු වෙයි. මන් ද, සංකේත වැරදුණහොත් පණිවිඩය ද වැරදීමට ඉඩ ඇති හෙයිනි.

**නාලිකාව/මාධ්‍යය - In Which Channel?**

සන්නිවේදක ස්ථානයේ සිට අපේක්ෂිත පාර්ශ්වය වෙත සන්දේශය ගෙන යනු ලබන්නේ නාලිකාව මඟිනි. සාමාන්‍යයෙන් එදිනෙදා සන්නිවේදනයේ දී භාවිත කරන නාලිකා වන්නේ පංචේන්ද්‍රිය යි. ඒ අතරින් ඇස (දැකීම) සහ කන (ඇසීම) බහුල ලෙස යොදා ගැනේ. තාක්ෂණයේ ආගමනයත් සමඟ මෙකී නාලිකා/මාධ්‍යවල සිදු ව ඇති පරිවර්තනයන් හඳුනා ගැනීම

**ග්‍රාහකයා To Whom**

සන්නිවේදකයා විසින් සිය සන්දේශය හුවමාරු කර ගැනීමේ අපේක්ෂාව ඇති ව එය ඉදිරිපත් කරනු ලබන්නේ කවරකු වෙත ද හේ ග්‍රාහකයා යි. ග්‍රාහකයන් විශාල ප්‍රමාණයක් ඇති විට ඒ හැම දෙනා 'ග්‍රාහක ක්ෂේත්‍රය' ලෙස හඳුන්වනු ලැබේ. සන්නිවේදන ක්‍රියාවලියෙහි දී ග්‍රාහකයා ද සන්නිවේදකයා හා සමාන වැදගත් බවක් උසුලයි. අතිශය වැදගත් වේ.

**බලපෑම - With What effect?**

සෑම සන්නිවේදනයක් ම කිසියම් බලපෑමක් ඇති කිරීමේ අපේක්ෂාවෙන් සිදු කෙරේ. එකී බලපෑමේ ස්වභාවය විවිධාකාර වන්නට පුළුවන. වරෙක එය ආකල්පමය හෝ චර්යාමය හෝ වෙනසක් ඇති කිරීම ඉලක්ක කර සිදු කරන සන්නිවේදනයක් විය හැකි අතර තවත් විටෙක ලාභය වැනි මූල්‍ය ප්‍රතිලාභයක් අරමුණු කර ගත හැකි ය. කෙසේ නමුත් සන්නිවේදන ක්‍රියාවලියේ සාර්ථකත්වය තීරණය වන්නේ අපේක්ෂිත බලපෑම සාක්ෂාත් කර ගත්තේ ද යන්න මත යි.

මෙම කරුණු නිදසුන් සහිත ව විස්තර කර තිබීම. (ලකුණු 12)

(iv) තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා පහත සඳහන් සාම්ප්‍රදායික මාධ්‍ය විධික්‍රම රූපවාහිනී මාධ්‍යයේ දී යොදාගත හැකි ආකාරය නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(අ) ජන කවි

උදා : දරු නැලවිලි, ගොයම් කවි, කමත් කවි, පාරු කවි, නෙළුම් කවි, රබන් කවි, ටීකා සීපද ආදී

(ආ) ගැමි නාටක

උදා : කෝලම්, සොකරි, රූකඩ

(මෙම කරුණු රූපවාහිනී මාධ්‍යයට අදාළ ව නිදසුන් සහිත ව විස්තර කර තිබීම)

රූපවාහිනී වැඩසටහන් සඳහා උදාහරණ

සංගීත වැඩසටහන් | වාර්තා වැඩසටහන් | සංවාද / සාකච්ඡා

සඟරාමය වැඩසටහන් | සජීවී විකාශ (ලකුණු 16)

5 සන්නිවේදනය, මාධ්‍ය සහ සංස්කෘතිය, එකිනෙකට අන්තර් සම්බන්ධිත සංකල්ප ත්‍රිත්වයකි.

(i) සන්නිවේදනය පිළිබඳ චාල්ස් එච්. කූලිගේ නිර්වචනයේ සඳහන් වන කරුණු දෙකක් ලියන්න.

- මානව සම්බන්ධතා රඳවා සිටීම
- මානව සම්බන්ධතා වර්ධනය කිරීම
- සියළු සංකේත දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීම
- කාලයේ බැඳුම්වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කරගැනීමට උපකාරී වන උපක්‍රම

(ලකුණු 04)

(ii) විද්‍යුත් මාධ්‍යයක් ලෙස ගුවන්විදුලි මාධ්‍යයේ මූලික ලක්ෂණ දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- ක්ෂණිකය.
- පුළුල් කලාපයක් ආවරණය කරයි.
- එක් දිශාවකට සංදේශ ගමන් කරයි.
- සරල ජංගම මාධ්‍යයකි.
- එක් වරක දී තේරුම්ගත හැකි ලෙස සංදේශ ඉදිරිපත් කළ යුතුය.
- එක් එක් ග්‍රාහක කොටස් ඉලක්ක කරගනිමින් වැඩසටහන් ඉදිරිපත් කළ හැකිය.
- අන්තර්ජාතික, ජාතික, ප්‍රාදේශීය සහ ප්‍රජා ගුවන්විදුලි ජාලා ඇතිකරගත හැකිය.
- ශ්‍රව්‍ය මාධ්‍යයක් ලෙස පරිකල්පන ශක්තිය ගොඩනැගීම අතින් ප්‍රබල ය.
- රූපවාහිනියට සාපේක්ෂ ව අඩු වියදම් සහිත මාධ්‍යයකි. (ලකුණු 08)

(iii) මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී අන්තර්ගත විය යුතු කරුණු පහත සඳහන් මාතෘකා තුන ඔස්සේ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

**(අ) මාධ්‍ය කර්මාන්තයේ හිමිකාරීත්වය**

මාධ්‍ය හිමිකාරීත්වය ලබාගත යුත්තේ කෙසේද? ඒ සඳහා අවශ්‍ය සුදුසුකම් මොනවාද? ආයතන හිමිකරුවන් විසින් සන්නිවේදන ක්‍රියාවලියේ දී අනුගමනය කළ යුතු කාර්යයන් මොනවාද? ආදිය පිළිබඳ ව අන්තර්ගත කර ඇත.

**(ආ) තාක්ෂණික යටිතල පහසුකම් හා තාක්ෂණික වර්ධනය**

මාධ්‍ය ආයතනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය යටිතල පහසුකම් හා තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ව තොරතුරු අන්තර්ගත කර ඇත.

උදා: පුවත්පත් මාධ්‍යයට අවශ්‍ය කඩදාසි, ගුවන්විදුලි මාධ්‍යයට අවශ්‍ය සංඛ්‍යාත ආදිය ලබාගත හැකි ආකාරය හා ඒවා භාවිත කළ හැකි ආකාරය

**(ඉ) මාධ්‍ය අධිකාරීන් හා වෙළෙඳ පොළ නියාමනය**

මාධ්‍ය අධිකාරීන් ලෙස රජය විසින් පත්කරනු ලබන මාධ්‍ය අධිකාරීන් හා ඔවුන් සතු කාර්යය භාරයන් පිළිබඳ ව, වෙළෙඳ පොළ තත්ත්වයන් පිළිබඳ ව විමසීමේ දී සංස්කෘතියට, සදාචාරයට ගැළපෙන ලෙස සන්දේශ ඉදිරිපත් කළ යුතු ආකාරය මාධ්‍ය ප්‍රතිපත්ති තුළ අන්තර්ගත කර ඇත. (ලකුණු 12)

(iv) මාධ්‍ය සංස්කෘතියේ ලක්ෂණ හතරක් නිදසුන් සහිත ව විස්තර කරන්න.

- ජනමාධ්‍ය මගින් ගොඩනංවයි.
- නවීකරණ අදහස් සමාජගත කරයි.
- තාක්ෂණය සමග සම්බන්ධ වේ.
- ජනප්‍රිය සංස්කෘතිය ප්‍රවර්ධනය කරයි.
- කෘතිම අවශ්‍යතා නිර්මාණය කරයි.
- ගතිකත්වයෙන් යුක්තයි.
- ගෝලීයකරණය හා සම්බන්ධ වේ.
- ව්‍යාපාරික ආධිපත්‍යයක් පවතියි.
- පෞද්ගලික සතුටේ, ප්‍රීතියේ, වින්දනයේ පරිභෝජනයේ සිට, ප්‍රාථමික, ජන, පරිභෝජනයේ බහුවිධ ස්වරූප සහ ශෛලීන් බවට පත්වේ. (ලකුණු 16)

6 (i) සිනමාවේ නිර්මාණාත්මක ප්‍රවේශ හතරක් නම් කරන්න.

සිනමාත්මක, චල වින්දන, ශබ්ද වින්දන

කාලීන, ආඛ්‍යාන, නාට්‍යමය, සිනමා නිර්මිතය (ලකුණු 04)

(ii) පහත දැක්වෙන මාධ්‍ය නියාමන ආයතන දෙක පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

(අ) ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය

- 2006 වසරේ ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය යටතේ පිහිටුවා ඇත.
- සමාජ මාධ්‍ය හා පරිගණක භාවිතය පිළිබඳ ව සොයා බැලීම
- විවිධ සංවිධාන හා පුද්ගලයින් විසින් සිදුකරනු ලබන සයිබර් අපරාධ සඳහා කඩිනමින් ප්‍රතිචාර දැක්වීම
- පරිගණක මගින් සිදුකරන වෙනත් අපරාධ, ත්‍රස්ත සංවිධානවල ක්‍රියාකාරීත්වයට එරෙහි ව දැනුම්වත් කිරීම, අනතුරු ඇඟවීම, විසඳුම් ලබාදීම

(ආ) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලය

- සංදර්ශන, ප්‍රසංග හා චිත්‍රපට මහජන ප්‍රදර්ශනයට පෙර නිරීක්ෂණය කර ඊට අදාළ නියාමන කටයුතු සිදුකිරීම
- 1912 ආරම්භ වී 1951 අංක 23 දරණ පනතින් මෙම ආයතනය ස්ථාපනය කොට ඇත
- චිත්‍රපට සිනමා ශාලාවලට මුදාහැරීමේ දී නිකුත් කරන සහතිකයට U, X, A වර්ගීකරණය ලබාදීම
- විවිධ මාර්ගෝපදේශයන්ට අනුගත ව චිත්‍රපටවල දෙබස්, දර්ශන ඉවත් කිරීම
- චිත්‍රපට පූර්ණ ලෙස වාරණය කිරීම
- මණ්ඩලයේ සාමාජිකයන් පත්කිරීම විෂයභාර අමාත්‍යවරයා සිදු කරයි. (ලකුණු 08)

(iii) නිර්මාණකරුවෙකුට අත්දැකීම් ලැබෙන ප්‍රමුඛ ක්‍රම තුනක් නිදසුන් සහිත ව විස්තර කරන්න.

**ස්ව අත්දැකීම්**

නිර්මාණකරුවෙකු නිර්මාණයක් සිදු කිරීමේ දී ස්වකීය නිර්මාණාත්මක චින්තනය මෙහෙයවමින්

පරිකල්පනයේ යෙදෙයි. එහිදී තම අත්දැකීම් මත නවකතාවක්, කෙටි කතාවක්, ගීතයක් ආදී කුමක් හෝ නිර්මාණාත්මක ක්‍රියාවලියක දී තම අත්දැකීම් යොදා ගනිමින් එම කාර්යයේ නිරත වීම ස්ව අත්දැකීම් යනුවෙන් හැඳින්වේ.

**අන්‍යයන්ගෙන් ලබන අත්දැකීම්**

නිර්මාණකරුවෙකු නිර්මාණ කාර්යයේදී තම අත්දැකීම් මත ම පදනම් වී එහි නිරත නොවේ. ඇතැම් අවස්ථාවල නිර්මාණකරණය සඳහා අන්‍යයන්ගේ අත්දැකීම් ද යොදාගනු ලබයි.

**මාධ්‍ය හෝ වෙනත් අත්දැකීම්**

ජනමාධ්‍ය හෝ වෙනත් මාධ්‍යයන් මගින් තමා අසන, දකින, කියවනු ලබන දේ ද නිර්මාණකරුවෙකුට තම නිර්මාණ සඳහා භාවිත කළ හැකිය. උදාහරණයක් ලෙස ජනමාධ්‍ය ඔස්සේ ඇසූ ප්‍රවෘත්තියක් පාදක කරගෙන ගීතයක්, නවකතාවක්, චිත්‍රපටයකට පිටපතක් ලිවීම.

(ලකුණු 12)

(iv) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය අන්තර්ගතයෙහි නව ප්‍රවණතා පහත දැක්වේ. වත්මන් මාධ්‍ය සන්දර්භයෙන් උදාහරණ දක්වමින් විස්තර කරන්න.

**(අ) සරල භාෂා භාවිතය**

ව්‍යක්ත භාෂා රටාව වෙනුවට සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගත් සරල වූත්, පහසුවෙන් අවබෝධ කර ගත හැකි වූත් කට වහර වඩාත් සමීප භාෂා ශෛලියක් මාධ්‍ය බහුතරයක භාවිතකෙරේ. ප්‍රවෘත්ති වාර්තාකරණයේ දී පවා විශේෂාංග රචනයේ දී භාවිත කරන බසට සමාන වූ භාෂා විලාසයක් යොදා ගැනේ.

**(ආ) වෙළඳ දැන්වීම් ප්‍රමාණාත්මක ව ඉහළ යාම**

පුවත් විවරය (News Hole) ක්‍රමයෙන් සීමා කරමින් ජනමාධ්‍ය මගින් ඉදිරිපත් කෙරෙන වෙළෙඳ දැන්වීම්වල ප්‍රමාණාත්මක වර්ධනයක් දක්නට ලැබීම කැපී පෙනෙන සාධකයකි.

දැන්වීම් ඉදිරිපත් කිරීමේ සාම්ප්‍රදායික විලාසයට පටහැනි ව යමින් ප්‍රවෘත්ති ආකාරයෙන් දැන්වීම් ඉදිරිපත් කිරීම (Advertorials) ද මාධ්‍ය අන්තර්ගතය සම්බන්ධයෙන් වන නව ප්‍රවණතාවකි

**(ඉ) ඉදිරිපත් කිරීමේ නව මාදිලි යොදා ගැනීම**

මාධ්‍ය අන්තර්ගතය ග්‍රාහකයා වෙත ඉදිරිපත් කිරීම ඒ ඒ මාධ්‍යවලට විශේෂ වූ නව මාදිලිවලට අනුව සිදු කිරීමට ගන්නා උත්සාහයක් ද මෑත කාලයේ දැකිය හැකි විශේෂිත තත්ත්වයකි. ශ්‍රව්‍ය හා ශ්‍රව්‍ය - දෘශ්‍ය මාධ්‍යවල බහුල ලෙස යොදා ගැනෙන යථාකාරී වැඩසටහන් (Reality Progeramms) මෙයට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

එමෙන් ම ඉහත මාධ්‍ය සංවාද වැඩසටහන් (Talks Shows) සම්බන්ධයෙන් දක්වන අවධානය ඉහළ ගොස් තිබීම ද නව ප්‍රවණතාවකි.

මේ නව මාදිලි භාවිතය මාධ්‍ය - ග්‍රාහක අන්තර් ක්‍රියාකාරිත්වය වර්ධනයට ද හේතුකාරක වීතිබේ.

මුද්‍රිත මාධ්‍ය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී ‘‘රූපකාරකයෙන්’’ තොරතුරු ඉදිරිපත් කිරීමට ඇති නැඹුරුවෙහි පැහැදිලි වර්ධනයක් පෙන්නුම් කරයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඡායාරූප, රූප සටහන්, කාටූන්, සිතියම්, සිතුවම් ආදිය වත්මන් මුද්‍රිත මාධ්‍යවල බහුල ලෙස දැකිය හැකි ය.

නිශ්චිත තොරතුරු වාර්තාකරණයට අමතර ව ‘‘ඕපාදූප’’ නැතහොත් නිල නොවන තොරතුරු සම්බන්ධයෙන් ද යම් තාක් දුරට අවධානය යොමු කිරීම නූතන මාධ්‍ය අන්තර්ගතය පිළිබඳ විමසා බැලීමේ දී සලකා බැලිය යුතු සාධකයක් බවට පත් ව තිබේ.

**(ඊ) විනෝදාස්වාදය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම**

සන්නිවේදනයේ අනෙකුත් අරමුණුවලට සාපේක්ෂ ව විනෝදාස්වාදය කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වීම ද ජනමාධ්‍ය අන්තර්ගතයේ තවත් නව ප්‍රවණතාවයක් ලෙස දැකිය හැකිය. උදාහරණයක් ලෙස රූපවාහිනී මාධ්‍යයේ ටෙලි නාට්‍ය, සංගීත වැඩසටහන්, චිත්‍රපට, කාටූන් ආදිය වැඩි වශයෙන් දැකිය හැකිවීම සඳහන් කළ හැකිය.

(ලකුණු 16)

7 වෙජී ඇග්‍රෝ (Vegi Agro) ආයතනය ප්‍රදේශවාසීන්ගේ ජීවන ක්‍රමය නංවාලමින් පාරිභෝගිකයන්ට නැවුම් එළවළු හා පළතුරු ලබාදීමේ සංවර්ධන ව්‍යාපෘතියක් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

(i) සංවර්ධනය සඳහා සන්නිවේදනයේ ප්‍රායෝගිකභාවය සම්බන්ධයෙන් සිල්වියෝ වයිස්බෝඩ් ඉදිරිපත් කළ ප්‍රධාන කරුණු දෙකක් සඳහන් කරන්න.

- කේන්ද්‍රගත බලය ශක්තිමත් කිරීම (පුද්ගලයන් හා ප්‍රජාවන් දැනුම අත්පත් කර ගැනීම හා ගැටලු සම්පාදනය කිරීම)
- ඉහළ-පහළ හා පහළ ප්‍රවේශ ඒකාබද්ධ කිරීම
- සන්නිවේදන මෙවලම් භාවිත කිරීම
- පුද්ගලාන්තර සන්නිවේදනය හා ජන සන්නිවේදනය අතර සමබරතාව නිර්මාණය
- කිරීම
- පුද්ගල හා සමාජ හැසිරීම් වෙනස් කිරීමේ වැඩසටහන්වලට ප්‍රමුඛතාව දීම

(ලකුණු 04)

(ii) වෙජී ඇග්‍රෝ ආයතනයට මහජන සම්බන්ධතා අවශ්‍ය වන අවස්ථා දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- මහජන ජීවිතය ඵලදායක කිරීම සඳහා ඒකාබද්ධතා ඇති කිරීම
- පොදුවේ සියලු ආකාරයේ සාමූහික ක්‍රියාදාම (නිදසුන් ලෙස මෙහෙයුම්, ගැටලු, ජයග්‍රහණ ආදිය) කෙරෙහි ජනතා සහභාගීත්වය පුළුල් ව ලබා ගැනීම
- නව භාණ්ඩ හෝ සේවා හඳුන්වා දීම
- තරගකාරීත්වයක් පවතින අවස්ථාවක ඇති වන ප්‍රතිවිරෝධය ජය ගැනීම
- සංවිධානයක් හා එහි පාර්ශ්වකරුවන් අතර ඇති වන මතභේදාත්මක තත්ත්ව සමනය කිරීම
- ආයතනයක් වෙත ඇති වන අයහපත් ව්‍යාජ ප්‍රසිද්ධියක් මත ප්‍රතිරූපයට වන හානි අවම කිරීම
- ව්‍යසන හා ආපදා තත්ත්වයක දී අදාළ දැනුම්වත් කිරීම
- තර්ජනීය තත්ත්ව පාලනය කර ගැනීමට (ලකුණු 08)

(iii) ව්‍යාපාර මහජන සම්බන්ධතා යටතේ භාවිත කළ හැකි මහජන සම්බන්ධතා උපක්‍රම තුනක් විස්තර කරන්න.

- වෙළෙඳ වට්ටම් ලබා දීම
- විශේෂ ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම
- ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම
- මාධ්‍ය ප්‍රචාරණ සිදු කිරීම
- වෙළෙඳ ප්‍රදර්ශන පැවැත්වීම
- මාධ්‍ය සම්බන්ධතා පැවැත්වීම හා
- අනුග්‍රාහකත්ව ලබා දීම යි (ලකුණු 12)

(iv) මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා සමූහ සන්නිවේදනය සාර්ථක කරගැනීමට ඉවහල් වන විධික්‍රම හතරක් උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.

- පෙර සූදානම
- අරමුණු සහගත බව
- අවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය
- විවිධ තාක්ෂණික උපකරණ මෙවලම් භාවිතය
- ප්‍රදීපාගාර උපක්‍රමය
- ආකර්ෂණීය කථන විලාසය
- ග්‍රාහක කේන්ද්‍රීය සන්නිවේදනය
- ග්‍රාහක ප්‍රතිචාර පිළිබඳ ව සැලකිලිමත් වීම
- කාල කළමනාකරණය
- ආචාරශීලීභාවය
- වගකීම හා වගවීම

මෙම කරුණු නිදසුන් සහිත ව විස්තර කර තිබීම. (ලකුණු 16)